# සාමාන්‍ය සමයේ විසිඑක්වන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ශුද්ධවූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි. 1 තෙසලෝනික 3: 7-13

"ස්වාමින් වහන්සේ සියල්ලන් කෙරෙහි ඔබගේ ප්‍රේමය පිරී ඉතිරී යන්නට සලස්වන සේක්වා."

සහෝදරවරුනි, අපගේ සියලු අමාරුකම්වලදීත් පීඩා වලදීත් ඔබගේ ඇදහිල්ල ගැන අසා අපි ධෛර්යවත් වීමු. ඔබ ස්වාමින් වහන්සේ තුළ ස්ථිරවී සිටින්නහු නම්, එය අපේ ජීවිතයේ පණ තළ වේ. ඔබ නිසා අපට ලැබී ඇති සකල ප්‍රීතිය ගැන දෙවියන් වහන්සේ ඉදිරියෙහි අපි කෙසේ ස්තුති කර සෑහීමකට පත් වෙමු ද? ඔබගේ මුහුණ දක්නා පිණිස ද, ඔබගේ ඇදහිල්ලේ ඌනතා සම්පූර්ණ කරන පිණිස ද, දිවා රෑ දෙකේහි අපි අධික ලෙස යාච්ඤා කරමු.

අපගේ දෙවි පියාණන් වහන්සේ ද ජේසුස් ස්වාමින් වහන්සේ ද ඔබ වෙත ඒමට අපට මාර්ගය සලසා දෙන සේක්වා! අප ඔබට ප්‍රේම කරන්නාක් මෙන් ස්වාමින් වහන්සේත් ඔබ එකිනෙකා කෙරෙහිත්, අන් සියල්ලන් කෙරෙහිත්, ඔබගේ ප්‍රේමය ඉතිරී යන්නට සලස්වන සේක්වා! අපගේ ස්වාමින් වන ජේසුස් වහන්සේ සිය සැදැහැවතුන් සමඟ වඩින විට, ඔබගේ සිත් අපගේ දෙවි පියාණන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධ ව ද, නිදොස් ව ද, තිබෙන ලෙස ශක්තිමත් කරන සේක්වා!

දේව වාක්‍යය එසේය.

# පිලිතුරු ගීය

ගීතාවලිය 90: 3-4, 12-14, 17

පිලිතුර: සමිඳුනි, ඔබ වහන්සේගේ ප්‍රේමයෙන් අප පුරවාලුව මැනව.

ගීය:

ඔබ මිනිසා යළි දූවිල්ලට හරවන සේක. "මිනිසුනි, දූවිල්ලට හැරේවා" කියා ඔබ වදාරණ සේක.
ඔබ ඇස් ඉදිරියෙහි වසර දහසක් ගෙවී ගිය ඊයේ දවස වැනි ය. රෑ යේ එක යාමයක් වැනි ය.

දිවි පෙවෙත කොතරම් ලුහුඬු ද කියා වටහා දුන මැනව. මෙය මෙනෙහි කරන පිණිස නැණවත් සිතක් අපට දුන මැනව.
සමිඳුනි, මෙපමණ දිගු කලක් ඈත් වී නොසිට ඔබ අප වෙත පෙරළා පැමිණිය මැනව. ඔබේ දාසයන්ට අනුකම්පා කළ මැනව.

උදයෙන් උදය ඔබවහන්සේගේ ප්‍රේමයෙන් පිරී අපි අවදි වමු. දවස පුරා තුටු පහටු සිතින් අපි ගී ගයමු.
අප දෙවිඳුන්ගේ කරුණාව අප කෙරෙහි බැබලේවා! අපේ වැඩ කටයුතු ඔබ මගින් ජයෙන් ජයටම පැමිණේවා!

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!

"ඔබ මාගේ මිතුරෝ ය. මන්ද, මාගේ පියාණන් වහන්සේගෙන් මා ඇසූ සියල්ලම ඔබට දන්වා වදාළ බැවිනි"යි සමිඳාණෝ වදාරන සේක.

ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!

"අවදිව සිට සූදානම් වන්න.

කුමක් නිසාද, ඔබ බලාපොරොත්තු නොවන පැයකදී මනුෂ්‍ය පුත්‍රයාණෝ වඩින සේක."

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 24: 42-51

"සූදානම් ව සිටින්න."

ක්‍රිස්තුස් වහන්සේ මෙසේ වදාළ සේක. "එබැවින් අවදිව ඉන්න. ඔබගේ සමිඳාණන් වහන්සේ කිනම් දවසක එන සේක්දැයි ඔබ නොදන්නහුය. සොරා කොයි යාමයේ එන්නේදැයි ගෙදර ස්වාමියා දැන සිටියේ නම්, ඔහු නොනිදා සිට තමාගේ ගෙය බිඳීමට ඉඩ නොදෙන බව දැන ගන්න. එබැවින් ඔබත් සූදානම්ව සිටින්න. කුමක් නිසා ද ඔබ බලාපොරොත්තු නොවන පැයකදී මනුෂ්‍ය පුත්‍රයාණෝ වඩින සේක."

තම ගෙයි වැසියන්ට නියම වේලාවට ආහාර කොටස සපයන පිණිස ස්වාමියා විසින් පත් කරන ලද විශ්වාසී, සිහි නුවණ ඇති දාසයා කවරෙක් ද? ස්වාමියා ආ කල යම් දාසයෙකු සිය සේවයෙහි යෙදී සිටිනු දුටුවොත්, ඒ දාසයා භාග්‍යවන්තයෙක් ය. සැබැවින්ම මම ඔබට කියමි. ඒ ස්වාමියා තමා සන්තක සියල්ලේ භාරකාරයා කොට ඔහු පත් කරන්නේය. එහෙත් ඔහු අයහපත් දාසයෙකු නම්, 'මාගේ ස්වාමියා පමා වනු ඇතැ'යි සිතින් සිතා, තම දැසි දසුන්ට තළන්නට පටන් ගෙන, බේබද්දන් සමඟ කමින් බොමින් සිටියොත්, ඔහු බලාපොරොත්තු නොවන දිනක දී, නොදන්නා පැයකදී ඔහුගේ ස්වාමියා අවුත්, ඔහුට දරුණු ලෙස දඬුවම් කර කෙරාටිකයන්ට නියමිත තැන ඔහුටත් නියම කරනු ඇත. එහිදී වැළපීමත් දත්මිටි කෑමත් වන්නේය."

සුවිශේෂ වාක්‍යය එසේය.